උක් පර්යේෂණ ආයතනය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 ව්‍යාචනය කළ මතය

උක් පර්යේෂණ ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 ව්‍යාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.2,493,635ක් වූ ප්‍රධාන ගබඩාව තුල පැවති ජී අයි පයිප්ප තොගයක් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට දේපළ, පිරියත හා උපකරණ රු.2,493,635ක් වැඩියෙන් ද තොගය ඊට සමාන වටිනාකමකින් අඩුවෙන් ද දක්වා තිබුණි.	සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබූ ජී.අයි. පයිප්ප තොගය අවශ්‍ය වූ ඉදිකිරීම් කටයුත්ත 2024 වර්ෂය තුල ආරම්භ කර එම වසර තුළදීම අවසන් කිරීමට කටයුතු කර තිබූ බැවින් එම ජී.අයි.පයිප්ප සඳහා වූ මුළු වියදම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇති බව.	ඉදිකිරීම් සඳහා ජී.අයි. පයිප්ප තොගය භාවිතා කර නොමැති බැවින් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	ඉකුත් වර්ෂවලට අදාල රු.1,520,852ක පර්යේෂණ දීමනා ගෙවීම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	පර්යේෂණය නිම කිරීමට වසර ගණනාවක් පුරා ගතවන බව, දීමනා සඳහා හිමිකම් ලබන පර්යේෂණ ඉතා සුළු ප්‍රමාණයක් වන බව, ගෙවීම් අනුමැතින් පර්යේෂණ නිම කිරීමෙන් පසුව ලැබෙන බව සහ 2024 වර්ෂයේ අනුමත වූ රු.1,520,852ක් ප්‍රවර්ථන වර්ෂයට ගිණුම්ගත කර ඇති බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ගිණුම් තැබිය යුතුය.
(ඇ)	2019 වර්ෂයේදී කොළඹ ප්‍රදේශයෙන් මිලදීගෙන තිබුණු පර්චස් 11.4 ඉඩම සහ ගොඩනැගිල්ල සඳහා රු. 38,349,500ක අත්පත් කර ගැනීමේ පිරිවැයක් දරා තිබුණි. මෙම දේපළ ගිණුම්ගත කිරීමේදී ඉඩම සහ ගොඩනැගිලි වෙන්කර ගිණුම්ගත කර නොතිබුණු අතර දරන ලද මුළු පිරිවැය ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර මුළු වටිනාකම සඳහා වාර්ෂික ක්ෂය ගණනය කර තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කටයුතු අවසන් කර ඇති බව සහ එම තක්සේරු වාර්තාව ලැබුණු පසු ගිණුම් ගත කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 සහ 07 අනුව ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඈ)	ඉදිරි මාස 12 ක කාලය තුළදී කල්පිරීමට නියමිත රු.99,473,220 ක ස්ථාවර තැන්පතු ශේෂ 02 ක් සහ රු.6,847,304ක භාණ්ඩාගාර බිල්පත් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු බැවින් ජංගම නොවන වත්කම් රු.106,320,524කින් වැඩියෙන්ද ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.	උක් පර්යේෂණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත රු.99,473,220ක් වටිනා ස්ථාවර තැන්පතු ශේෂය හා රු.6,847,304ක භාණ්ඩාගාර බිල්පත් ශේෂය ජංගම වත්කම් තුළ පෙන්වීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ඉදිරිපත් කළ යුතුය.

(ඉ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 41 ඡේදය ප්‍රකාරව ගිණුම් කරන ඇස්තමේන්තු වෙනස්වීමක බලපෑම ප්‍රවර්තන වර්ෂයේ ලාභයට සහ ඉදිරි වර්ෂවල ලාභයට ගැලපිය යුතු වුවද, නිලධාරීන් දෙදෙනෙකුගේ පසුගිය වර්ෂ දෙකක වෛද්‍යාධාර සඳහා වෙන් කිරීම්වල ඉතිරි ශේෂ පදනම්ව ප්‍රවර්තන වර්ෂය තුළ දී ගෙවා තිබුණු රු.93,982 ක වෛද්‍ය වියදම් සහ වර්ෂය තුළ ඉවත්ව ගිය නිලධාරීන් 13 දෙනෙකු සඳහා ඉකුත් වර්ෂයේ වෙන් කර තිබුණු රු.327,100 ක් රඳවාගත් ඉපයුම්වලට ගළපා තිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 03 ප්‍රකාරව වෛද්‍යාධාර වියදම් රු.93,982 ගැලපීමමට කටයුතු කරන බව.	ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස් වීම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03ට අනුකූල වන පරිදි ගැලපුම් කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෛද්‍ය වියදම් සඳහා ප්‍රතිපාදනය කර තිබුණු රු.3,583,848 ක ශේෂය තුළ සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයෙන් ඉවත්ව ගිය නිලධාරීන් 13 දෙනෙකු සඳහා වෙන් කරන ලද රු.450,994 ක් ඇතුළත් කර තිබුණු බැවින් වෛද්‍ය වියදම් සඳහා ප්‍රතිපාදන රු.450,994ක් වැඩියෙන් දක්වා තිබුණි.	සමාලේචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෛද්‍යාධාර වියදම් ප්‍රතිපාදන තුළ අන්තර්ගත ඉවත්ව ගිය නිළධාරින් 13 දෙනා වෙනුවෙන් ප්‍රතිපාදිත රු.450,944ක ශේෂය නිවැරදිව ගැලපීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03ට අනුකූල වන පරිදි ගිණුම් නිවැරදි කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයට අදාළ රු.7,699,934ක වෛද්‍ය වියදම් (සුභසාධන වියදම්) වැටුප් වියදම් ශීර්ෂය යටතේ වාර්තා කර තිබුණු අතර, රු.14,486ක වෛද්‍ය වියදම් සඳහා අධි වෙන් කිරීම වෙනත් ආදායම් යටතේ ඉදිරිපත් කර තිබුණි	සමාලෝචිත වර්ෂයේ රු.7,699,934ක වෛද්‍යාධාර වියදම (සුභසාධන වියදම්) වැටුප් ශීර්ෂය (පුද්ගල පඩිනඩි) යටතේ දැක්වීම නිවැරදි කිරීමට සහ වෛද්‍යාධාර අධි හෝ ඌණ වෙන් කිරීම සුභසාධන වියදම් යටතේම ගැලපීමට කටයුතු කරන බව.	වියදම්වලට අදාල නිවැරදි වැය ශීර්ෂ හඳුනාගෙන ගිණුම් නිවැරදි කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්ෂේත්‍ර උපකරණ සහ කෘෂි උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණු රු.6,207,600 ක වත්කම් ඉකුත් වර්ෂයේ දී මෝටර් රථ ලෙස හඳුනාගෙන ගිණුම් අතර මාරු කර තිබුණි. කෙසේ නමුත්, ක්ෂේත්‍ර උපකරණ සහ කෘෂි උපකරණ වාර්ෂිකව පිරිවැය මත සියයට 15ක් ද, මෝටර් රථ වාර්ෂිකව සියයට 25 ක් ද ක්ෂය කිරීම ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය වන බැවින් මෙම ක්ෂය අනුපාතයන්ගේ වෙනස් වීම හේතුවෙන් ඉකුත් වර්ෂ වලට අදාළව අඩුවෙන් වාර්තා කර තිබුණු ක්ෂය වටිනාකම සඳහා ගැලපීම් කර නොතිබුණි.	අදාල ක්ෂය වටිනාකම නිවරදි කිරීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03ට අනුකූල වන පරිදි ගිණුම් නිවැරදි කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට පොදු ලෙජරය අනුව රඳවා ගත් ඉපයුම් ගිණුමෙහි ශේෂය රු.249,393,070 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන තුළ එම ශේෂය රු.77,596,156 ක් ලෙස රු.171,796,914 ක් අඩුවෙන් ඉදිරිපත් කර තිබුණි.	ශේෂ පිරික්සුමේ හා මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් රු.77,596,156/- ශේෂය නිවැරදි ශේෂය වන අතර එම ශේෂය අවසන් මූල්‍ය ප්‍රකාශ තුළද අන්තර්ගත වේ. රඳවාගත් ඉපයුම් ගිණුමේ වැරදි ශේෂයක් පෙන්වීම ගිණුම්කරණ පද්ධතියේ පැවති දෝෂයක් වන බැවින් එය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03ට අනුකූල වන පරිදි ගිණුම් නිවැරදි කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල් සඳහා සේවකයාගේ දායකය වශයෙන් වැටුපෙන් අඩුකර තිබුණු සියයට 10 ක ප්‍රමාණය වන රු.13,547,180 දළ වැටුප යටතේ හඳුනානොගෙන සේවක අර්ථසාධක අරමුදල් වියදම් ගිණුමට හර කර තිබුණු බැවින් වැටුප් වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, සේවක අර්ථසාධක අරමුදල් වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.	මෙම දායක මුදල් ගෙවීම් කිරීම නිවැරදිව ගැලපීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03ට අනුකූල වන පරිදි ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට පැවති පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය තුළ ඇතුලත් සේවකයින් 14 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.10,547,550ක පාරිතෝෂික මුදල් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි	පාරිතෝෂික මුදල් ගෙවීමේදී පසුගිය වසරවලට අදාලව එක් එක් සේවකයන් වෙනුවෙන් වෙන් කර ඇති මුදල් පාරිතෝෂික වෙන් කිරීම් ගිණුම මඟින් ගැලපීමටද ප්‍රවර්ථන වර්ෂයට අදාල පාරිතෝෂික මුදල එම වර්ෂයට අදාලව ගිණුම්ගත කිරීමට ද කටයුතු කරන බව.	වියදම් සඳහා සිදු කරන ප්‍රතිපාදනයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ගැලපුම් කළ යුතුය.
(ඈ)	ආයතනය විසින් භාවිතා කරන හෙක්ටයාර 207.363 ක් වූ ඉඩම් කැබලි 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු බැවින් දේපළ පිරියත හා උපකරණ වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.	සියඹලාණ්ඩුව, දෙනියාය හා කන්තලේ යන උප මධ්‍යස්ථාන වලට අයත් ඉඩම් කැබලි වල අයිතිය පිළිබඳ ගැටළුකාරී තත්වයන් පැවතීම හා ඒවා නිරවුල් නොවීම හේතුවෙන් එම ඉඩම්වල අයිතිය සම්බන්ධව ගැටළු නිරාකරණයෙන් අනතුරුව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශණ තුලට ලබා ගැනීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි දැක්වෙන නිර්ණායක අනුව දේපල පිරියත හා උපකරණ නිවැරදිව හඳුනාගත යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේපල පිරියත හා උපකරණ	158,009,293	තක්සේරු වාර්තා	තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලද වත්කම් වලට සහ ආයතනයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුව විසින් තක්සේරු කළ වත්කම්වලට අදාල තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 07ට අනුකූලවන වෘත්තීය තක්සේරුකරුවන් ගේ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ආ)	පාරිතෝෂිත වෙන්කිරීම්	100,206,723	සුදුසුකම්ලත් තක්සේරුකරුවන්ගේ ආයුගණන තක්සේරු වාර්තාව	පාරිතෝෂික වෙන් කිරීම්, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත ප්‍රකාරව ගණනය කරනු ලබන අතර ඒ අනුව කරන ලද වෙන් කිරීම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කර ඇති බව.	සුදුසුකම්ලත් තක්සේරුකරුවන් ගේ ආයුගණන තක්සේරු වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	අවසන් තොගය	33,277,162	තොග සත්‍යාපන වාර්තා	භෞතික තොග සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	භෞතික තොග සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සීනි නිෂ්පාදන ආයතන 03 කින් ලැබිය යුතු රු.4,890,951ක මුදලක් වසර 02 ක සිට වසර 05 ක කාලයක් දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ණය මුදල් අයකර ගැනීමට එම ආයතන ලිපි මඟින් දැනුවත් කරන බව, රේඛීය අමාත්‍යාංශයෙන්ද ගෙවීම් කරන ලෙස අදාල ආයතන වලට දැනුම් දී තිබෙන බව සහ ඒ පිළිබඳව යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති බව.	ණය ශේෂ කාලීනව අය නොකළ නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීමටත්, අක්‍රීය ණය ශේෂ අය කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i) මුදල් රෙගුලාසි 757(2) සහ (4)	භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	තොග හා වත්කම් සමීක්ෂණය අවසන් කර ඇති බව සහ එම සමීක්ෂණ වාර්තා කඩිනමින් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතුය.
(ii) මුදල් රෙගුලාසි 1646	දෛනික ධාවන සටහන්පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ධාවන සටහන් මාසිකව විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැති බව, ඉල්ලුම් කල අවස්ථාවල ඉදිරිපත් කරන ලද බව සහ 2024 ජූලි මස සිට මාසික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බව.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත කාලය තුළදී ධාවන සටහන් ඉදිරිපත් කළ යුතුය

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.46,807,733 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.49,180,086 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,372,353ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ආදායම රු.25,345,791කින් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයේ රු.286,096,000ක් වූ රජයේ ප්‍රාග්ධන හා අයහාර ප්‍රදානය සමාලෝචිත වර්ෂයේදී රු.320,616,000 දක්වා රු.34,520,000කින් වැඩි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කන්තලේ සීනි කර්මාන්තශාලාව ආරම්භ කිරීමේ අරමුණින් ඊට අවශ්‍ය බීජ උක් සැපයීම, ප්‍රදේශයට සුදුසු උක් ප්‍රභේද තෝරා ගැනීම ඇතුළුව පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැපයීම අරමුණු කරගෙන 2011 වර්ෂයේදී කන්තලේ සීනි කර්මාන්තායතනය සතු ඉඩමෙන් අක්කර 400 ක භූමි ප්‍රමාණයක් හා ගොඩනැගිලි 13 ක් උක් පර්යේෂණ ආයතනයට ලබාදී තිබුණු අතර ආයතනය විසින් 18 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර 2024 වර්ෂය දක්වා වසර 13 ක කාලය තුළ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 147.5 ක් වැයකර තිබුණද, කන්තලේ සීනි කර්මාන්තායතනය ආරම්භ නොකිරීම නිසා එම පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි.	කන්තලේ සීනි කර්මාන්තය ආරම්භ කිරීමේ අරමුණ තවදුරටත් පවතින බැවින් මෙම උප මධ්‍යස්ථානය පවත්වාගෙන යන ලෙස රේඛීය අමාත්‍යාංශය විසින් වාචිකව දැනුම්දී ඇති බව සහ මේ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ අනුව පාලක මණ්ඩලය වෙත යොමු කර රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරන බව.	කන්තලේ උප මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳව නැවත සලකා බැලීමටත්, එහි වත්කම්වලින් නිසි ප්‍රයෝජන ලබා ගැනීමටත් කටයුතු කල යුතුය.

3.2 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අවස්ථා 05 කදී ගබඩාව තුළ වටිනාකම රු.456,373 ක් වූ ග්ලයිෆොසෙට් ලීටර් 860 ක් බැරල් වලින් කාන්දු වී තිබුණු බව දක්වමින් එම ප්‍රමාණය තොග ලේඛන වලින් අඩුකර තිබුණද මුදල් රෙගුලාසි 103 සහ 104 ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර එම පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි	2025.04.10 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ නිර්දේශ අනුව මේ සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා විමර්ශනයක් පැවැත්වීමට කමිටුවක් පත්කර ඇති බව.	වගකිවයුතු පාර්ශ්වයන් හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීමට සහ අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයට අදාළව කාර්යාල සංවිධාන සංග්‍රහයක් (MOP) සකස් කිරීම සඳහා 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන (SLIDA) ආයතනයට රු.217,383 ක අත්තිකාරම් මුදලක් හා 2024 වර්ෂයේදී රු.217,383 ක් ලෙස එකතුව රු.434,766 ක් ගෙවා තිබුණු නමුත්, කාර්යාල සංවිධාන සංග්‍රහය විගණනය වෙත ඉදිරිපත් නොවුණි	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් සකස් කරන ලද කාර්යාල සංවිධාන සංග්‍රහය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2025 පෙබරවාරි 20 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව.	කෙටුම්පත් කාර්යාල සංවිධාන සංග්‍රහය විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ)	නිලධාරීන් 05 දෙනෙකු වෙත උපාධි පාඨමාලා සහ වෙනත් වෘත්තීය විභාග හැදෑරීමේ වියදම් ලෙස 2003 වර්ෂයේ සිට රු.11,513,991 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම පාඨමාලා කාලයන් අවසන් වී තිබුණු නමුත් නිලධාරීන් විසින් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරගත් බවට විගණනයට තහවුරු නොකෙරුණි.	උපාධි පාඨමාලා හා වෙනත් වෘත්තීය විභාග හැදෑරීමේ වියදම් හා වාර්තමාන තත්ත්වය පිළිබඳව විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇති බව.	නියමිත පරිදි පාඨමාලා සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ගෙන් අදාළ පාඨමාලා ගාස්තුව නැවත අය කර ගත යුතුය.
(ඇ)	පුනරාවර්ථන වියදම් සඳහා මහ භාණ්ඩාගාරය විසින් නිකුත් කරන අරමුදල් යොදා ගනිමින් වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ වෙනුවට ජාතික රක්ෂණභාර අරමුදල මගින් රක්ෂණාවරණය ලබාගත යුතු බව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් 2017 වර්ෂයේදී දැනුම් දී තිබුණි. ඒ පිළිබඳව අවධානය යොමු නොකර ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදීද භාණ්ඩාගාර අරමුදල් යොදා ගනිමින් රු.7,824,328ක වෛද්‍යාධාර දීමනා ගෙවා තිබුණි.	1984 අංක 75 දරන උක් පර්යේෂණ ආයතන පනතේ 3 (ඊ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආයතනයේ සේවා නියුක්තිකයන්ට සුබසාධන පහසුකම් සැලැස්වීම යටතේ මෙම වෛද්‍යාධාර යෝජනා ක්‍රමය ආයතනය ආරම්භයේ සිට මේ දක්වා පාලක මණ්ඩලයේ අනුමැතිය මත ක්‍රියාත්මක වන බව.	1981 අංක 75 දරණ උක් පර්යේෂණ ආයතන පනතේ 3 (ඊ) වගන්තිය අනුව සේවක සුභසාධන සහ විනෝදාංශ පහසුකම් ලබාදීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරන පුනරාවර්තන අරමුදල් භාවිතා කිරීමට ප්‍රතිපාදන සලසා නොමැති බැවින් යොමුගත වගන්තියේ සඳහන් අරමුදලක් මගින් එම කටයුතු කළ යුතුය.
(ඈ)	ආයතනයේ අරමුදල් භාවිතා කර සේවකයින් සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට සේවකයින් 07 දෙනෙකුගෙන් රු.3,820,637ක නිවාස ණය අය වීමට තිබුණි. තවද අදාළ නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විධිමත් අනුමැතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	කාර්ය සංවිධාන සංග්‍රහයේ IX පරිච්ඡේදයට අනුව චක්‍රීය අරමුදලක් මගින් ණය වර්ග ලබාදෙන බව සහ එය පාලක මණ්ඩල අනුමැතිය මත ක්‍රියාත්මක කරන බව.	විධිමත් අනුමැතිය ලබාගැනීමෙන් පසුව ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කල යුතුය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අත්තිකාරම් සුරක්ෂණ ලබාගැනීමකින් තොරව විවිධ බාහිර ආයතන වෙත සමාලෝචිත වර්ෂයේ අවස්ථා 36 කදී රු.3,854,067 ක මුදලක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණු අතර විගණිත දිනය වූ 2025 අප්‍රේල් 25 දින වන විටත් ඉන් රු.341,312ක අත්තිකාරම් පියවා නොතිබුණි	මෙම අත්තිකාරම් වලින් පියවා නොතිබුණු රු.341,312කින් 2025 අප්‍රේල් 30 වන විට රු.12,534ක් පියවා ඇති බව, ඉතිරි අත්තිකාරම් කඩිනමින් පියවීමට කටයුතු කරන බව සහ ඉදිරියේදී අත්තිකාරම් සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කරන බව.	හිඟ අත්තිකාරම් මුදල් කඩිනමින් පියවාගත යුතු අතර අත්තිකාරම් සුරක්ෂණ රහිතව අත්තිකාරම නිකුත් කිරීමට කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

(ආ)	2019 වර්ෂයේදී සංවර්ධන කටයුතු අවසන් කරන ලද SL03 983 , SL03 1025 සහ SL03 1077 යන උක් ප්‍රභේද නිකුත් කිරීම සඳහා කරනු ලබන මහමෝල් පරීක්ෂණය (Large – Mill Test) සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් සිදුකර නොතිබුණි	අදාළ නව උක් ප්‍රභේද 2020 වර්ෂයේදී සීනි සමාගම් සහ උක් ගොවීන් වෙත ලබාදෙන ලද බව, මහා පරිමාණ ප්‍රභේද ඇගයීම් 2021 වසරේදී ආරම්භ කල අතර එය 2024 වසරේදී සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණු බව සහ වගාව ව්‍යාප්ත කිරීමට ප්‍රමාණවත් බීජ උක් නිපදවීමට නොහැකි වූ බව.	නොපමාව මහමෝල් පරීක්ෂණ සිදු කර ඉදිරි කටයුතු කළ යුතුය
(ඇ)	ආයතනය විසින් පෙර වර්ෂයේදී නිෂ්පාදන කටයුතු අවසන් කර තිබුණු පොහොර ශාක පෝෂක නිෂ්පාදනයක් සහ පළිබෝධ නිෂ්පාදන 05 ක් සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි	පේටන්ට් අයදුම්පත සඳහා අවශ්‍ය ලියකියවිලි සහ තොරතුරු SRIiBL වෙත ඉදිරිපත් කර, පේටන්ට් අයදුම් ක්‍රියාවලිය ආරම්භ වී ඇති බව.	කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ කටයුතු කිරීමටත්, පේටන්ට් බලපත්‍රය ලබාගැනීමට කඩිනම් පියවර ගැනීමත් කළ යුතුය

3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයේ නිලධාරීන් 64 දෙනෙකු සඳහා මාසිකව කුලී අයකිරීමෙන් තොරව නිල නිවාස ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී නිල නිවාසවල විදුලි ගාස්තු වෙනුවෙන් ආයතනය විසින් රු.1,881,383ක් වැයකර තිබුණි.	1984 අංක 75 දරන උක් පර්යේෂණ ආයතන පනතේ 3 (ඊ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සුබසාධන පහසුකම් සැලැස්වීම යටතේ මෙම නිල නිවාස ලබා දීම හා විදුලිය සැපයීම පාලක මණ්ඩල අනුමැතිය මත සිදුකර ඇති බව, සුබසාධන කටයුතු යටතේ ඒ ඒ ශ්‍රේණි සඳහා හිමි විදුලි ඒකක ප්‍රමාණයක් පමණක් ලබා දෙන බව.	1981 අංක 75 දරණ උක් පර්යේෂණ ආයතන පනතේ 3 (ඊ) වගන්තිය අනුව සේවක සුභසාධන සහ විනෝදාංශ පහසුකම් ලබාදීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරන පුනරාවර්තන අරමුදල් භාවිතා කිරීමට ප්‍රතිපාදන සලසා නොමැති බැවින් යොමුගත වගන්තියේ සඳහන් අරමුදලක් මගින් එම කටයුතු කළ යුතුය.
(ආ)	කාර්යාලයේ සහ නිල නිවාස වල ජල ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් රු.364,325 ක් වැයකර තිබුණු නමුත් නිල නිවාස සඳහා ජල මීටර් සවිකර නොතිබුණු බැවින් නිල නිවාසවල ජල පරිභෝජනය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි	1984 අංක 75 දරන උක් පර්යේෂණ ආයතන පනතේ 3 (ඊ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සුබසාධන පහසුකම් සැලැස්වීම යටතේ මෙම ජලය සැපයීම ආයතනයේ පාලක මණ්ඩල අනුමැතිය මත ක්‍රියාත්මක වන බව.	1981 අංක 75 දරණ උක් පර්යේෂණ ආයතන පනතේ 3 (ඊ) වගන්තිය අනුව සේවක සුභසාධන සහ විනෝදාංශ පහසුකම් ලබාදීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරන පුනරාවර්තන අරමුදල් භාවිතා කිරීමට ප්‍රතිපාදන සලසා නොමැති බැවින් යොමුගත වගන්තියේ සඳහන් අරමුදලක් මගින් එම කටයුතු කළ යුතුය.

3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගෙන ගබඩා අයිතම මිලදීගෙන තිබුණු බැවින් රු.8,437,096 ක් වටිනා තොග අයිතම 52 ක් වසර 05 කට අධික කාලයක සිට නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි	ගබඩා අයිතම සම්බන්ධයෙන් කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගන්නා ලද අතර එම කමිටු නිර්දේශ අනුව කටයුතු කර ඇති බව.	නිෂ්කාර්ය තොග විදිමත් පරිදි බැහැර කල යුතු අතර එම තොග මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයේ ශ්‍රවණාගාරයේ, රසායනාගාරයේ හා කන්තලේ ආරක්ෂක මුරකුටියේ ඇලුමිනියම් දොරවල් හා ජනේල සවිකිරීමේ කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරුවකු තොරාගැනීමේ දී, පිළිගත හැකි හේතු දැක්වීමකින් තොරව අවම ලංසුව ප්‍රතික්ෂේප කරමින් අවම මිලට වඩා රු.502,595 ක් වැඩි මිලක් ඉදිරිපත්කළ ලංසු කරුවෙකු වෙත කොන්ත්‍රාත්තුව පිරිණමා තිබුණි. ගෙවීම් බිල්පත් අනුව, එකඟ වූ මිල ගණන් ඉක්මවා වැඩ විෂයන් 11 ක් සඳහා රු.271,018 ක් වැඩිපුර ගෙවා තිබුණ අතර වැඩ විස්තරය අනුව, සම්පූර්ණයෙන්ම වීදුරු යොදා නිම කිරීමට ගිවිසුම් ගත වී තිබුණ දොරවල්, වීදුරු හා ක්ලැඩින් යොදාගෙන නිමකර තිබුණ ද වීදුරු යොදා නිමකිරීමේ රේටය මත ගෙවීම් කර තිබීමෙන් රු.83,519 ක් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබුණි.	අවම මිල ගණන් ඉදිරිපත් කල සැපයුම්කරු අදාල ICTAD ලියාපදිංචිය සපුරා නොතිබුණු බැවින් ඇගයීමේදීම එම සැපයුම්කරු නුසුදුසු සැපයුම්කරුවෙකු ලෙස හදුනා ඒ බව තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවේ සඳහන්ව ඇති බව. මෙම ඉදිකිරීම සම්බන්ධ ඇස්තමේන්තුව 2020 වර්ෂයේ ලබාගෙන, මිල කැඳවීම් කර 2021 වර්ෂයේ ජුනි මස කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව සහ තෝරා ගත් ලංසුකරුගේ මිල ගණන් සහ ඇස්තමේන්තු මිල ගණන් රු.6,56342 වෙනසක් පවතින බැවින් එය ඇස්තමේන්තු මිල ගණනට ඉටු කර ගැනීමට සාකච්ඡා සිදු කරන ලද බව. ඇස්තමේන්තුව අනුව සම්පූර්ණ වීදුරු යෙදීම සඳහන් වුවත් අවශ්‍ය ආරක්ෂාව සලකා වෙනස් කර ඇති බව සහ ප්‍රසම්පාදන කමිටුව හා සාකච්ඡා කර එකඟ වූ මිල ගනන් යටතේ පමණක් ගෙවීමට කටයුතු කර ඇති බව.	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන්ගෙන් රජයට සිදුකර තිබෙන අලාභය අයකර ගතු යුතු අතර විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදිකිරීම් කර්මාන්ත 30 ක් සඳහා බාහිර පාර්ශව වෙත ගාස්තු ගෙවා ඇස්තමේන්තු සකස් කරවා ගෙන තිබුණි. ඒ අතරින් 2021 වර්ෂයේ දී මහවැලි අධිකාරියේ ලිපි ශීර්ෂ භාවිතා කරමින් ඉදිකිරීම් කර්මාන්ත දෙකක් සඳහා එකතුව රු.24,411,265 ක ඇස්තමේන්තු සකාසා ඉදිරිපත් කළ මහවැලි	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරු මහතාගේ ඉල්ලීම අනුව ගෙවීම් කටයුතු සිදුකර ඇති බව. ඉදිකිරීම් කිරීමට ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදනයන් නොමැති වීම නිසා අදියර කිහිපයකින් එම කාර්යන් සිදු කිරීමට යෝජනා වූ බව සහ මේ සඳහා මිල දී ගත් ද්‍රව්‍ය යොදා ගනිමින් 2025 වර්ෂයේ කොටසක් සහ ඉදිරි වර්ෂ වලදීද ඉතිරි කොටස්	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අක්‍රමිකතාවයන්ට අදාල වගකිව යුතු නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කිරීමත්, රජයට වී ඇති අලාභයන් අයකර ගැනීමටත් කටයුතු

	අධිකාරියේ නිලධාරියෙකු වෙත, ඇස්තමේන්තු සැකසීමේ ගාස්තු ලෙස රු.976,425 ක් ඔහුගේ පුද්ගලික ගිණුමට බැරවන පරිදි ගෙවා තිබුණි. එහෙත් එම ඇස්තමේන්තු දෙකට අදාළ ඉදිකිරීම් කටයුතු 2025 මැයි 02 දින දක්වාත් ආයතනය විසින් ආරම්භ කර නොතිබුණි. තවත් ඉදිකිරීම් කර්මාන්ත 20 ක් සඳහා බාහිර පුද්ගලයින් දෙදෙනෙකු සහ ආයතනයක් වෙතින් එකතුව රු.33,704,917 ක ඇස්තමේන්තු සකස් කර ගෙන ඇස්තමේන්තු සකස් කිරීම් ගාස්තු වශයෙන් රු.621,456ක් ගෙවා තිබුණු ද එම ගාස්තු ගෙවීමේ පදනම සහ ගාස්තු ගෙවීමට ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	වලට අදාල ඉදිකිරීම් කටයුතු සිදු කරන බව. ඉංජිනේරු සේවාව සඳහා ගෙවිය හැකි අනුමත අනුපාතය මත (5% ක උපරිමය) ගෙවීම සඳහා ප්‍රසම්පාදන කමිටුව තම නිර්දේශ ලබා දී ඇති බැවින් කමිටුව බලය අභිබවා කටයුතු කර නොමැති බව. උක් පර්යේෂණ ආයතනයේ ලියාපදිංචි සේවා සපයන පුද්ගලයකු හා ආයතනයක් මගින් සෘජුවම ඉංජිනේරු සේවය ලබා ගැනීමට කටයුතු කරන ලද බව.	කළ යුතුය.
(ඇ)	දෙනියාය උක් බීජ අභිජනන මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය, රැඳවුම් බැම්ම සහ ගේට්ටුව ඉදිකිරීම සඳහා වැඩ විෂයයන් 15 ක් ඇතුළත් කර රු . 1,285,930 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර ඇස්තමේන්තු සකස් කිරීමේ ගාස්තු ලෙස බාහිර පුද්ගලයෙකු වෙත රු.19,289 ක් ගෙවා තිබුණි .අනුමත ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණු වැඩ විෂයයන් 09 ක් ඉටුකර ඒ සඳහා අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත්කරු වෙත රු .1,041,165 ක් ගෙවා තිබුණ අතර, නියමිත සම්මත මිල ගණන් යොදා නොගෙන වැඩ විෂයයන් දෙකක් සඳහා එකතුව රු.263,603 ක් වැඩියෙන් ගෙවා තිබුණි. තවද, මෙම අමතර වැඩ සඳහා ගෙවීම් කළ මුදල තුළ වෙනත් කර්මාන්තයකට අදාළ එකතුව රු.51,000 ක වැඩ විෂයයන් 3 ක්ද ඇතුළත් කර තිබුණි.	අමාත්‍යාංශ ලේකම් දැනුවත් කිරීම හා පාලක මණ්ඩලයේ අනුමැතියට යටත්ව අදාල ගෙවීම් සිදු කර ඇති බව. තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුව ප්‍රසම්පාදන කමිටු අනුමැතියට යටත්ව ගෙවීම් සිදු කර ඇති බව. ආයතනයේ අවශ්‍යතාවය පරිදි එවකට සිටි අධ්‍යක්ෂකයේ උපදෙස් මත එම ඇස්තමේන්තු දෙකෙහිම ඇතුලත් නොවූ නමුත් වැඩ අවසන් කිරීමට අවශ්‍ය වැඩ කොටස් සඳහා ඇස්තමේන්තුවක් ලබාගෙන මුදල ගෙවා ඇති බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා නිසි අනුමැතිය රහිතව සිදුකර ඇති ගෙවීම් පිළිබඳව වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කල යුතුය.

4. **මානව සම්පත් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේශීය උක් වගාවේ උසස් වාණිජමය උක් ප්‍රභේද දියුණු කිරීම හා ඒ සඳහා පර්යේෂණ පැවැත්වීම වෙනුවෙන් පිහිටුවා ඇති එකම ආයතනය උක් පර්යේෂණ ආයතනය වුවද එහි පර්යේෂණ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය ප්‍රධාන තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂක (පර්යේෂණ සහ තාක්ෂණ හුවමාරු) තනතුර 2020 වර්ෂයේ සිටද ප්‍රධාන තාක්ෂණ හුවමාරු නිලධාරී තනතුර, ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 05 ක් හා ජ්‍යෙෂ්ඨ තාක්ෂණික හුවමාරු නිලධාරී තනතුර එම තනතුරු ඇතිකළ දින සිටද පුරප්පාඩුව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පර්යේෂණ නිලධාරී තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණි.	පුරප්පාඩු තනතුරු කඩිනමින් පිරවීමට අනුමැතිය ඉල්ලා රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව සහ අදාළ අනුමැතීන් ලද වහාම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව.	වර්තමාන කාර්ය භාරය අනුව කාර්ය මණ්ඩල විශ්ලේෂණයක් සිදු කර අවශ්‍ය පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට කටයුතු කළ යුතුය.